# අම්පාර රජගල පුරාවිද්‍යා භූමියේ පරිහානියට බලපෑ සමාජ හේතු සාධක සහ සංරක්ෂණයේ අවශ්‍යතාව පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක්

වයි. එල්. එම්. මෙන්ඩිස්[1], එම්. ටී. එස්. කේ. පීරිස්[2], ඩබ්. එම්. ටී. කේ. වලිසුන්දර[3]

## හැඳින්වීම

නැගෙනහිර පළාතේ අම්පාර දිස්ත්‍රික්කයේ උහන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ රජගලතැන්න ග්‍රාම සේවා වසමේ පිහිටා ඇති රජගල ලංකාවේ දැකිය හැකි වැදගත් පුරාවිද්‍යා ක්ෂේත්‍රයකි. දුටුගැමුණු රජතුමාගේ සහෝදරයෙකු වන සද්ධාතිස්ස කුමරුගේ පුත්‍රයා වන ලජ්ජිතිස්ස රජතුමා විසින් ක්‍රි.පූ. 119-109 වැනි කාලයේ මෙම විහාර සංකීර්ණය ආරම්භ කළ බව මහා වංශයේ සඳහන් වේ. ලජ්ජිතිස්ස රජතුමාගේ කාලයේ ස්ථාපනය කළ ශිලා ලේඛන සහිත ලෙන් ගණනාවක් රජගල තැන්න පුරාවිද්‍යා භූමියේ දැකිය හැකි අතර අනුරාධපුර යුගයේ රජගල විහාර සංකීර්ණය විවිධ වූ නාමයන් ගෙන් හඳුන්වා ඇත. මෙම රජගල පුරාවිද්‍යා භූමිය විශාල ආරාම සංකීර්ණයක් වූ බව වර්තමානයේ දක්නට ලැබෙන සාධකයන් ඇසුරෙන් පෙන්වාදිය හැකිය. භූමියේ ආරාම, ස්ථූප, ගුහා සිතුවම්, ශිලා ලිපි, පොකුණු, දාන ශාලා යන ගෘහ නිර්මාණය සහ කැටයම්, මූර්ති, ප්‍රතිමා දැක ගත හැකි විශිෂ්ට පුරාවිද්‍යා සොයාගැනීම් විශාල සංඛ්‍යාවක් පවතින අතර, ඒවා ශ්‍රී ලංකාවේ ආගමික හා සමාජීය සංවර්ධනය පිළිබඳව අපූර්ව සාක්ෂි සපයයි. මෙවැනි සංස්කෘතික හා ආගමික වශයෙන් වැදගත් ස්ථානයක් වන රජගලතැන්න පුරාවිද්‍යා භූමිය වර්තමානය වන විටත් ශ්‍රී ලංකාවේ ඒ හා සමකාලීන වූ ඓතිහාසික ස්ථාන මෙන් සංරක්ෂණය සඳහා වැඩි අවධානයක් යොමු වී නැත. එම නිසා මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ වන්නේ මෙම පුරාවිද්‍යා භූමියේ ඇති සංස්කෘතික හා ආගමික වටිනාම් පෙන්වා දෙමින් එය සංරක්ෂණය අවශ්‍යතාවය පෙන්වා දීමය.

රජගලතැන්න පුරාවිද්‍යා භූමියේ ඇති චෛත්‍යය ශ්‍රී ලංකාවේ කිසිදු ස්ථානයකින් හමු නොවූ ලෙස ඉන්දියාවේ සාංචි ස්ථූපයට සමානකම් දැක්වීම, ඉන්දීය - ශ්‍රී ලාංකික කලා ලක්ෂණ පිළිබිඹු කරන සන්ධිස්ථානයක් බවට කිව හැකිය. එසේම බුදුන් වහන්සේ සංකේතාත්මකව නිරූපණය, මුරගල්, සඳකඩ පහණ විකාශනය එකම ස්ථානයක් තුළින් අධ්‍යයනය කළ හැකි වීම, ගෘහ නිර්මාණ තාක්ෂණය, ජලය බෙදා හැරීමේ තාක්ෂණය වැනි වටිනාකම් රාශියක් මෙම පුරාවිද්‍යා ක්ෂේත්‍රය මගින් විමර්ශනය වේ. තවද ගුහා සිතුවම් ශිලා ලිපි මගින් එකල ජන ජීවිතය පිළිබඳ තොරතුරු, බොහෝමයක් අනාවරණය කර ගත හැකි වේ. එම නිසා මෙම පුරාවිද්‍යා භූමිය සංස්කෘතික අංග රැසක් එකතු වූ කලාගාරයක් වේ. පසුගිය දශකවල දී ඇති වූ උතුරු නැගෙනහිර යුදමය වාතාවරණය, දේශගුණ විපර්යාස, වනාන්තර විනාශය, සංරක්ෂණය සඳහා මුදල්

1 මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය, පේරාදෙණිය, ශ්‍රී ලංකාව. lakindumusic@gmail.com

2 මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය, පේරාදෙණිය, ශ්‍රී ලංකාව. sewwandikaushani888@gmail.com

3 මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය, පේරාදෙණිය, ශ්‍රී ලංකාව. w.m.t.k.walisundara@gmail.com

ප්‍රතිපාදන වෙන් නොවීම්, ශ්‍රම හිඟය, නීති ක්‍රියාත්මක නොවීම හේතු කොට මෙම අගනා උරුමය දැඩි අවදානමකට මුහුණ දී ඇති බව පර්යේෂණයේ පසුබිමෙන් පැහැදිලි වේ. මෙම පර්යේෂණයේ අරමුණ වූයේ රජගල පුරාවිද්‍යා භූමිය පරිහානියට බලපෑ සමාජ හේතු සාධක අධ්‍යයනයෙන් එහි සංරක්ෂණයේ අවශ්‍යතාව වර්තමානය වන විට මතුවී ඇති බව පෙන්වා දීමය. පර්යේෂණ ක්‍රමවේදය සම්පූර්ණයෙන්ම ගුණාත්මක ආකෘතියක් මත පදනම් වූ අතර, ලේඛන ගවේෂණ, ක්ෂේත්‍ර නිරීක්ෂණ, ඡායාරූප හා සිතියම් විශ්ලේෂණය, ප්‍රාදේශීය ජනතාව හා විශේෂඥයන් සමග සංවාද යොදා ගැනීම මගින් දත්ත එකතු කරන අතරම රජගල භූමිය ශ්‍රී ලංකාවේ බෞද්ධ උරුමය පිළිබඳව පූර්ව සාධක හමුවන බවත්, එය ඉතිහාසය හා සංස්කෘතිය විග්‍රහ කිරීමට මූලික මූලාශ්‍රයක් බවත්ය. නමුත් නිසි පියවර නොගතගොත් පුරාණ ගොඩනැගිලි විනාශ වීම, මෙම උරුමය අනාගතයේදී නොපැවතිය හැකි තත්ත්වයක් ඇතිවිය හැක. එබැවින් මෙම පර්යේෂණ ගැටලුව ලෙස රජගල පුරාවිද්‍යා භූමියේ පරිහානිය හා සංරක්ෂණයට බලපාන සමාජ හේතු සාධක කෙසේ බලපායිද? යන්න සොයා බලමින් මෙම පුරාවිද්‍යා භූමිය නව සංචාරක කලාපයක් වශයෙන් දෙස් විදෙස් සංචාරකයින්ගේ ආකර්ෂණයට මගපෙන්වීමක් ලෙස මෙම පර්යේෂණය වැදගත් වේ.

**ප්‍රධාන අරමුණු**

- රජගල පුරාවිද්‍යා භූමියේ ඓතිහාසික හා සංස්කෘතික වැදගත්කම අධ්‍යයනය කිරීම
- රජගල පුරාවිද්‍යා භූමියේ පරිහානියට බලපාන සමාජ￼ සංස්කෘතික සාධක හඳුනා ගැනීම
- පුරාවිද්‍යා උරුම සංරක්ෂණය පිළිබඳ ප්‍රදේශවාසීන්ගේ දැනුවත්භාවය හා සහභාගීත්වය විමර්ශනය කිරීම
- ශ්‍රී ලංකාවේ අනෙකුත් පුරාවිද්‍යා භූමිවලට සාපේක්ෂව මෙම පුරාවිද්‍යා භූමිය කෙරෙහි අඩු අවධානයක් යොමුවන්නට හේතු අධ්‍යයනය කිරීම
- රජගල පුරාවිද්‍යා භූමිය තිරසාර ලෙස සංරක්ෂණය කිරීම සඳහා යෝජනා ඉදිරිපත් කිරීම මෙන්ම එය නව සංචාරක ආකර්ෂණීය කලාපයක් ලෙස හඳුනාගත හැකි බව විමර්ශනය කිරීම

**පර්යේෂණ ක්‍රමවේදය**

මෙම පර්යේෂණය සඳහා මූලික වශයෙන් ගුණාත්මක දත්ත ක්‍රමවේදය භාවිත කිරීමට අපේක්ෂා කෙරේ. පර්යේෂණයේ දත්ත එක්රැස් කිරීම සඳහා ප්‍රාථමික හා ද්විතීක මූලාශ්‍ර උපයෝගී කරගනු ලබයි.

**ප්‍රාථමික මූලාශ්‍රය**

ක්ෂේත්‍ර අධ්‍යයන හා සහභාගීත්ව නිරීක්ෂණයන් සිදුකිරීම. කලා විචාරකයින් සහ කලා ඉතිහාසඥයින් සමග සම්මුඛ සාකච්ඡාවක් පැවැත්වීම. ක්ෂේත්‍ර නිරීක්ෂණ,

ප්‍රාදේශීය ජනතාව හා විශේෂඥයන් සමග සංවාද පැවැත්වීම.

**ද්විතීයික මූලාශ්‍රය**

අදාල විෂය අළලා රචනා වී ඇති ග්‍රන්ථ ලිපි සහ සඟරා ආදිය පරිශීලනය කිරීම.

**ආකෘතිවාදී අධ්‍යයන ක්‍රමය**

දෘශ්‍ය කලා ව්‍යාකරණ සමූහයක් දෘශ්‍ය මූලධර්ම ඔස්සේ යම්කිසි කලා කෘතියක් ගොඩනගා ඇති ආකාරය ආකෘති ගොඩනැගීම ලෙස හැඳින්විය හැක. මෙහිදී මූලිකවම සිදු වන්නේ කලා කෘතියක් තුළ දක්නට ලැබෙන දෘෂ්‍ය මූලිකාංග පිළිබඳ අධ්‍යයනය කර විචාරය ගොඩ නැගීමයි.

**සන්දර්භීය අධ්‍යයන ක්‍රමය**

මෙම අධ්‍යයනය ක්‍රමය තුළ කලාකෘතියේ ආකෘතිය පිළිබඳ අධ්‍යයනයේ නිරත වනවාට වඩා අන්තර්ගතය දෙස අවධානය යොමු කෙරේ.

**ප්‍රතිඵල හා සාකච්ඡාව**

රජගල පුරාවිද්‍යා භූමිය ශ්‍රී ලංකාවේ නැගෙනහිර පළාතේ පිහිටි වැදගත් පුරාවිද්‍යාත්මක හා සංස්කෘතික උරුම ස්ථානයක් ලෙස හඳුනාගත හැකිය. මෙම භූමිය තුළ පුරාණ ආරාම සංකීර්ණ, ශිලා ලේඛන, ස්තූප හා විවිධ ගෘහ නිර්මාණ අවශේෂ දක්නට ලැබෙන අතර, එය ශ්‍රී ලංකාවේ ඉතිහාසය, ආගමික සම්ප්‍රදායන් සහ සංස්කෘතික පරිණාමය අධ්‍යයනය කිරීම සඳහා වැදගත් මූලාශ්‍රයකි. මෙහිදී අප රජගලතැන්න පුරාවිද්‍යා භූමියේ සුවිශේෂී ලක්ෂණ කිහිපයක් හඳුනාගන්නාා ලදී.

එනම් ඉන්දීය කලා ලක්ෂණ හඳුනාගත හැකි සාක්ෂි හමුවීම.



එනම් ඉන්දියාවේ සාංචි ස්තූපයට සමාන අනුරුවකින් රජගලතැන්න භූමියේ ඇති චෛත්‍යය හමුවේ.

බුදුරජාණන් වහන්සේ සංකේත අයුරින් ඉදිරිපත් කිරීම.



මුරගල්, සඳකඩ පහණ විකාශනය එකම ස්ථානයක අධ්‍යයනය කළ හැකි වීම.






**ජලය බෙදා හැරීමේ තාක්ෂණය**




ජලය බෙදා හැරීම සඳහා යොදාගත් ගල්පාත්‍ර

මෙවැනි සුවිශේෂී ලක්ෂණ හඳුනාගත් මෙම පුරාවිද්‍යා භූමිය පිළිබඳව ලියැවී ඇති පර්යේෂණ අල්ප වශයෙන් පවතී. එසේම වටිනා හරසංස්කෘතික සංස්පර්ශ රැසකින් සමන්විත පුරාවිද්‍යා භූමියකි. මෙවැනි වටිනා ස්ථානයක් වර්තමානයේ දී සංරක්ෂණය සඳහා යොමු වුවත් අනෙකුත් පුරා විද්‍යා ස්ථාන මෙන් සංරක්ෂණය සඳහා අවධානය යොමු නොවී ඇති බව අපහට දකින්නට ලැබිණි.

කාලයත් සමග මෙම පුරාවිද්‍යා භූමිය විවිධ සමාජමය සාධක හේතුවෙන් පරිහානියට ලක්ව ඇති බව හඳුනා ගත හැකිය. රජගල පුරාවිද්‍යා භූමියේ පරිහානියට බලපෑ ප්‍රධාන සමාජ හේතුවක් ලෙස දේශපාලන හා සමාජ අස්ථාවරතාව පෙන්වා දිය හැකිය. විශේෂයෙන් ශ්‍රී ලංකාවේ උතුරු හා නැගෙනහිර ප්‍රදේශවල පැවති දිගුකාලීන සිවිල් යුද්ධය හේතුවෙන් මෙම ප්‍රදේශවල සංවර්ධන හා සංරක්ෂණ කටයුතු බොහෝ අවස්ථාවල සීමා විය. ආරක්ෂක තත්ත්වයන්, ජනතාවගේ සංචරණ සීමා සහ රාජ්‍ය ආයතනවල ක්‍රියාකාරීත්වයට ඇති වූ බාධා හේතුවෙන් පුරාවිද්‍යා ස්ථාන නිසි අධීක්ෂණයකින් හා නඩත්තුවකින් තොරව පැවති අවස්ථා දක්නට ලැබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස වනාන්තර ආක්‍රමණය, ස්මාරක විනාශය සහ අනවසර ක්‍රියාකාරකම් වර්ධනය විය.

උදාහරණයක් ලෙස, උතුරු හා නැගෙනහිර ප්‍රදේශවල පිහිටි පුරාවිද්‍යා ස්ථාන කිහිපයක් යුද සමයේදී නිසි සංරක්ෂණයකින් තොරව පැවතීම හේතුවෙන් ඒවායේ භෞතික තත්ත්වය පිරිහීමට ලක්විය. රජගල ප්‍රදේශය ද මෙම පුළුල් සමාජ පසුබිම තුළ බලපෑමට ලක් වූ අතර, දිගුකාලීන අධීක්ෂණ හිඟය හේතුවෙන් පුරාවිද්‍යා අවශේෂ ආරක්ෂා කිරීම අභියෝගයක් විය. තවද, ප්‍රදේශවාසීන් අතර පුරාවිද්‍යා උරුමය පිළිබඳ දැනුවත්භාවය අඩුවීමද පරිහානියට බලපාන වැදගත් සාධකයකි. ඇතැම් අවස්ථාවල පුරාවිද්‍යා භූමි ආරක්ෂා කළ යුතු සංස්කෘතික සම්පත් ලෙස නොව, දෛනික අවශ්‍යතා සඳහා භාවිත කළ හැකි භූමි ලෙස සලකා ඇත. අනවසර ඉඩම් භාවිතය, පුරාවස්තු සෙවීම සහ ස්මාරකවලට හානි කිරීම මෙහි ප්‍රතිඵල ලෙස හඳුනාගත හැකිය. එසේම අප මෙහි දී ක්ෂේත්‍ර ගවේෂණය සිදුකිරීමේ දී විදේශීය සංචාරයන්ගේ අවධානයක් යොමු නොවූ බවට ද මෙම පුරාවිද්‍යා භූමිය හඳුනා ගත හැකිවිය.

එබැවින් රජගල පුරාවිද්‍යා භූමියේ තිරසාර සංරක්ෂණය යනු පුරාණ ගොඩනැගිලි හා පුරාවස්තු ආරක්ෂා කිරීම පමණක් නොව, ඒ හා බැඳුණු සමාජීය හා සංස්කෘතික වටිනාකම් ආරක්ෂා කිරීමකි. ඒ සඳහා ශ්‍රී ලංකා පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, ප්‍රාදේශීය ප්‍රජාව, අධ්‍යාපන ආයතන සහ අනෙකුත් පාර්ශ්වකරුවන්ගේ සහයෝගීතාව අත්‍යවශ්‍ය වේ. ප්‍රජා දැනුවත් කිරීම, නීතිමය ආරක්ෂාව ශක්තිමත් කිරීම, විද්‍යාත්මක සංරක්ෂණ ක්‍රම භාවිතය සහ වගකීමෙන් යුතු සංචාරක කළමනාකරණය මගින් රජගල වැනි උරුම ස්ථාන අනාගත පරපුර සඳහා සුරක්ෂිත කළ හැකිය. ඒ අනුව, පුරාවිද්‍යා උරුමයන්ගේ පැවැත්ම තීරණය වන්නේ භෞතික සංරක්ෂණ ක්‍රියාවලිය මත පමණක් නොව, ඒවා වටා පවතින සමාජ වටිනාකම්, ජනතා සහභාගීත්වය සහ වගකීම් සහිත කළමනාකරණය මත බව මෙම අධ්‍යනයෙන් පෙනී යයි.

**නිගමනය**

රජගල පුරාවිද්‍යා භූමිය පරිහානියට ප්‍රධාන වශයෙන් සමාජමය හා මිනිස් ක්‍රියාකාරකම් බලපා ඇති බව තහවුරු විය. පුරාවිද්‍යා උරුම සංරක්ෂණය පිළිබඳ ජනතා දැනුවත්භාවය සහ සහභාගීත්වය ප්‍රමාණවත් නොවීම සංරක්ෂණයට අභියෝගයක් වී ඇත. තිරසාර සංරක්ෂණය සඳහා රාජ්‍ය ආයතන, ප්‍රදේශීය ප්‍රජාව සහ අනෙකුත් පාර්ශ්වකරුවන්ගේ ඒකාබද්ධ ක්‍රියාකාරීත්වය අත්‍යවශ්‍ය වේ. නිසි සංරක්ෂණ හා

කළමනාකරණ ක්‍රමවේද ක්‍රියාත්මක කිරීමෙන් රජගල පුරාවිද්‍යා භූමිය අනාගත පරපුර සඳහා සුරක්ෂිත කිරීමට මෙන්ම නව දෙස් විදෙස් සංචාරක ආකර්ෂණය දිනාගත හැකි ස්ථානයක් බවට පත්කළ හැකි බව නිගමනය වේ.

**ප්‍රමුඛ පද** - රජගල, පුරාවිද්‍යා, පර්යේෂණය, සංස්කෘතිය, සංරක්ෂණය

## ආශ්‍රිත ග්‍රන්ථ

කරුණාරත්න, එච්.එච්.ඒ. (2016). *රජගල ආරාමික පරිශ්‍රයේ ජල කළමණාකරණය පිළිබඳ අධ්‍යයනයක්*", රාජකීය ආසියාතික සංගමය, (දහවන වාර්ෂික පර්යේෂණ සමුළුව). කොළඹ: මහවැලි කේන්ද්‍රය.

කරුණාරත්න, එච්.එච්.ඒ. (2016). "*රජගල ලෙන්වලින් හෙළිවන වාස්තුවිද්‍යා ලක්ෂණවල උපයෝගිතාව*, රාජකීය ආසියාතික සංගමය, (හයවන වාර්ෂික පර්යේෂණ සමුළුව). කොළඹ: මහවැලි කේන්ද්‍රය.

ජයවර්ධන, ආර්. ජී. ඩී. (2014). *දකුණු ආසියානු බෞද්ධ කලාවේ සංකේත*. ආරිය ප්‍රකාශකයෝග

තල්වත්ත, ඒ. (2006). *ශ්‍රී ලංකාවේ වැදගත් ඓතිහාසික ස්ථාන*. වාසනා ප්‍රකාශකයෝ.

ප්‍රඥාවංශ, බී. (2005). *භාරතීය බෞද්ධ කලා ගවේෂණ සහ සිංහල කලාවේ සජීවී ලක්ෂණ*. කොළඹ 10: එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

මැන්ඩිස්, සුගතපාල (2011). *යුද්දෙන් පස්සේ නැගෙනහිර පළාතේ ගවේශනයක්*, කොළඹ 10: එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

මේධානන්ද හිමි, එල්ලාවල. ((2003). *පාචීනපස්ස උත්තරපස්ස නැගෙනහිර පළාත හා උතුරු මැද පළාතේ සිංහල බෞද්ධ උරුමය*, දයාවංශ ජයකොඩි සමාගම.

*රජගල පුරාවිද්‍යා පර්යේෂණ*, (2018). පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනයකි.

සිරිසෝම. එම්.එච්. (1986). *උතුරු නැගෙනහිර පෙදෙසෙහි හෙල උරුමය*, කොළඹ 10: එස්. ගොඩගේ සහ සහෝදරයෝ.